# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2024/43 - 2017 ජුනි මස 22 වැනි බ්‍රහස්පතින්දා - 2017.06.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු මැද පළාතේ පළාත් සභාව

බලය පැවරීමේ නියෝගය

උතුරු මැද පළාත් සභාවේ 2009 අංක 05 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව උතුරු මැද පළාත් ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපකාර වෙළඳ හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍ය සුසිල් ගුණරත්න වන මම උතුරු මැද පළාත් සභාවේ 2011 අංක 01 දරන සමුපකාර සමිති සංශෝධන ප්‍රඥප්තිය සමග කියවෙන 2009 අංක 05 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ බලතල වලින් උතුරු මැද පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාට සහය වීමට සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා පත්කර ඇත්තා වූ පහත සඳහන් උපලේඛනයෙහි I වැනි තීරුවෙහි සඳහන් අය වෙත එම උපලේඛනයේ III වැනි තීරුවෙහි සඳහන් සියලු බලතල II වැනි තීරුවෙහි සඳහන් දින සිට මෙයින් පවරමි.

සුසිල් ගුණරත්න,
ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපකාර වෙළඳ
හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍ය,
උතුරු මැද පළාත.

2017 ක් වූ ජුනි මස 20 දින.

**උපලේඛනය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| කොණකලගල මැදවත්තේ කුසුම් ජයලතා | 2017.06.20 | උතුරු මැද පළාත් සභාවේ 2011 අංක 01 දරන සමුපකාර සමිති සංශෝධන ප්‍රඥප්තිය සමග කියවෙන 2009 අංක 05 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 03, 04, 05, 06, 07, 08, 44, 45, 58, (58(3), 58(4) හා 58(5) හැර) 59 (59 (1)ආ හැර) වගන්ති යටතේ රෙජිස්ට්‍රාර්ගේ බලතල හා 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 61 වැනි වගන්තිය යටතේ සම්පාදිත 1973 සමුපකාර රීති මාලාවේ 04, 11, 16(II), 19, 33, 35, 37, 39, 40, 41, (41 (I) අ හැර) 42, 49, (49 XII හැර) 51, 52 සහ 53 දරන රීති යටතේ රෙජිස්ට්‍රාර්ගේ බලතල. |

07 - 206

1A - PG 3581 — 10 (2017/06)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*